**ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම - 2019**
---------------------------------------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 හි 37 ඡේදය ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස්වීම මත වන බලපෑම ඉදිරිකාලීනව (prospectively) හඳුනාගත යුතු වුවද, රු. 314,527 ක විගණන ගාස්තු ඌන වෙන්කිරීම සහ රු. 46,800 ක අධ්‍යක්ෂ ගාස්තු අධිවෙන්කිරීම සමාලෝචිත වර්ෂයේ ලාභයට ගැළපීම වෙනුවට පෙර වර්ෂයේ ලාභයට ගලපා තිබුණි. | 2020 වර්ෂයේදී වටිනාකම් තක්සේරුවක් කරන ලද අතර ඉදිරි වර්ෂයේදී අදාළ නව තක්සේරු වටිනාකම් සමග ඉදිරිපත් කරන්නෙමු. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවකාලය අඩුවශයෙන් සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය නොකිරීම හේතුවෙන් තවදුරටත් භාවිතයට ගනිමින් පැවති එකතු වටිනාකම රු. 18,141,754 ක් වූ වත්කම් වර්ග දෙකක ධාරණ අගය ශූන්‍ය අගයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කර ඉදිරිපත් කරන්නෙමු. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව ලැබිය යුතු එකතුව රු. 8,042,054 ක් අයකර ගැනීමට කළමනාකරණයේ අවධානය | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් 2020 ඔක්තෝබර් 31 වන විට කොමිස් මුදල්ද ඇතුලුව ලැබීමට ඉතිරිව ඇත්තේ රු. 907,725 ක මුදලක් පමණක් වන අතර අනෙකුත් ලැබිය යුතු මුදල් | දීර්ඝ කාලයක සිට අයවිය යුතු ශේෂ ලෙස දක්වා ඇති මෙම මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත |

| | | |
|---|---|---|
| යොමු කර නොතිබුණි. | පිළිබඳව 2020 වර්ෂයේදී අදාළ ශේෂ තහවුරුවකින් පසු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා මේ පිළිබඳ යොමුකර ඊට අදාළ පියවර ගැනීමට කටයුතු කරනු ඇත. | යුතුයි. |

**1.6.2** ගෙවිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් වෙළඳ හා වෙනත් ගෙවිය යුතු වියදම් තුළ දක්වා ඇති එකතුව රු. 53,918,359 ක ශේෂය දීර්ඝ කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේදී වෙනත් ණයහිමි හා උපචිත වියදම් ශේෂ තහවුරුවකින් පසු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා මෙය යොමුකර ඊට අදාළ පියවර ගැනීමට කටයුතු කරනු ඇත . මරණ වන්දි ප්‍රමාදයට හේතුව විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් නීත්‍යානුකූල වන්දි ලාභීන්ගේ නාම ලේඛණ ඉදිරිපත් කිරීමට තවමත් නොහැකි වීමයි. මුදල් ගෙවීමට නියමිත නිර්දේශිත වන්දිලාභියාගේ නාම ලේඛණ ලැබුණු විගස ගෙවීම සිදුකරනු ලබයි. වීසා මුදල් නැවත ලබා ගැනීම සඳහා මේ වන තෙක් කිසිදු ශ්‍රමිකයෙක් ඉල්ලීම් කර නොමැති අතර ඉල්ලීම් කල විගස අදාල ගෙවීම් කටයුතු කිරීමට හැකියාව ඇත. | ගෙවිය යුතු ශේෂ පියවීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයෙ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,015,782 ක පාඩුවක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ලාභය රු.6,648,782 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 9,664,564 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සේවා සැපයීම් ආදායම අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාගමෙහි සමස්ත ආදායමින් සියයට 46.83 ක් ස්ථාවර තැන්පතු ආයෝජන මඟින් උපයන ලද පොලිය වූ අතර ව්‍යාපාරික කටයුතු වලින් උපයන ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 12.39 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ සමස්ථ ආදායම වූ රු. 22,696,922 කින් සියයට 68.8 ක් එනම් රු.15,635,790 ක් සේවක පිරිවැය වෙනුවෙන් වැයකර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විදේශ රැකියා ඒජන්සි සමාගම සහ ජපානයේ IR ආයතනය (INTERNATIONAL RELATIONS ORGANIZATION) අතර 2018 වර්ෂයේදී ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව ජපානය වෙත තාක්ෂණික පුහුණුලාභීන් විදේශගත කිරීමේ වැඩසටහන ආරම්භ කරන ලද අතර විදේශගත කරන ලද එක් පුහුණුලාභියෙකු වෙනුවෙන් පරිපාලන වියදම් ලෙස සමාගම වෙත යෙන් 5,000 ක මාසික ගාස්තුවක් හිමිවන බව එම ගිවිසුමේ දක්වා තිබුණි. එහෙත් 2020 ජුලි 30 වන විට විදේශගත කරන ලද පුහුණුලාභීන් 12 දෙනෙකු ගෙන් ගිවිසුම් ප්‍රකාරව එම මුදල් සමාගම වෙත ලබාගැනීමට 2020 සැප්තැම්බර් 08 දින වන විටත් කටයුතු කර නොතිබූ අතර ඉහත ගිවිසුමේ සඳහන් කොන්දේසිවලට පටහැනිව සමාගම විසින් පරිපාලන වියදම් ලෙස විදේශගතකරන ලද එක් පුහුණුලාභියකුගෙන් රු. 224,413 ක් ලෙස පුහුණුලාභීන් 12 දෙනෙකුගෙන් රු. 2,692,956 ක් අයකරගෙන තිබුණි. | විදෙස් ගත වූ එක් අයෙක් වෙනුවෙන් බදවා ගැනීම් වියදම් ලෙස රු. 250,000 ක මුදලක් අප ආයතනයට ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් ලබා ගෙන ඇත. තවද විදේශ සේවා නියුක්ති කාර්යංශයේ පලමු අනුමැති අංශයෙන් එක් අයෙකු වෙනුවෙන් අය කර ගත හැකි මුදල ලෙස රු. 278,885 ක මුදලක් සඳහාද අනුමැතිය ලබා ගෙන ඇත.<br>විදෙස් ගත වන එක් අයෙකු වෙනුවෙන් යෙන් යෙන් 5,000 බැගින් යෙන් 205,000 මුදලක් අදාල ආයතනය මගින් අප ආයතනයට 2020 සැප්තැම්බර් 28 දින ගෙවා තිබුණි. | වැඩසටහනෙහි ගිවිසුම අනුව විදේශගතවන තාක්ෂණික පුහුණුලාභීන්ගෙන් පරිපාලන වියදම් වෙනුවෙන් අදාල විදේශීය ආයතන විසින් ගෙවීම් කිරීමට එකඟවී තිබියදී පරිපාලන ගාස්තු ශ්‍රමිකයන්ගෙන් අයකිරීම නොකළ යුතුය. ඒ අනුව මෙම වරද නිවැරදි කිරීමටත් ගිවිසුමට පටහැනිව විදේශගතවූ පුහුණු අභ්‍යාසලාභීන්ගෙන් අයකර ඇති මුදල් නැවත ගෙවීමටත් කටයුතු කල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 හා 2019 වර්ෂවල සමාගමට රටවල් 10 කින් රැකියා ඇනවුම් 22 ක් යටතේ රැකියා අවස්ථා 4106 ක් ලැබී තිබුණි. ඉන් සමාගම වෙත ඍජුවම ලැබී තිබූ රැකියා ඇනවුම් 18 කට අදාල රැකියා අවස්ථා 2568 වර්ෂ 02 ක් සඳහා වලංගුව පැවති ඇණවුම් වෙනුවෙන් විගණන දිනය වූ 2020 අගෝස්තු 31 වන විටත් ශ්‍රමිකයින් 43 දෙනෙකු පමණක් එනම් ඇණවුම් ප්‍රමාණයෙන් සියයට 1.67 ක් යොමුකර තිබුණි. එසේ වුවද, බාහිර පාර්ශව විසින් සමාගම වෙත ඉදිරිපත්කරන ලද රැකියා ඇනවුම් 4 ට අදාළ රැකියා අවස්ථා 1528 න් ශ්‍රමිකයින් 366 දෙනෙකු එනම් සියයට 23 ක් රැකියා සඳහා යොමුකර තිබුණි. | 2018 සහ 2019 යන වර්ෂයන් තුලදී විදේශ රැකියා සමාගම විසින් අනුමැතිය ලබාගත් එක් එක් රැකියා ඇණවුම් පිළිබඳ තත්වය සහ ඒ පිළිබඳ ගැටලු වාර්තා කර ඉදිරිපත් කර ඇත. | සමාගම වෙත ලැබෙන රැකියා ඇණවුම් සඳහා සුදුසු ශ්‍රමිකයින් තෝරාගෙන රැකියා අවස්ථා සඳහා යොමු කිරීමේ කඩිනම් සහ කාර්යක්ෂම වැඩපිළිවෙළක් සමාගම විසින් ස්ථාපිත කල යුතුය. එමෙන්ම සමාගමට මෙතෙක් ලැබී ඇති රැකියා ඇනවුම් සඳහා ශ්‍රමිකයින් යොමු නොකිරීමට හේතු ද පරීක්ෂා කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.12,392,320 ක් එනම් සියයට 51 කින් අඩුවී තිබුණි. එමෙන්ම සමාගම සතු මුළු ආයෝජන රු. 99,047,029 ක් වුවත්, රු.53,918,359 ක ගෙවිය යුතු වියදම් පැවතීම සහ සමාලෝචිත වර්ෂයේ රු. 2,909,762 ක පාඩුවක් ලබා තිබීම හේතුවෙන් එහි මූල්‍ය තත්වය සතුටුදායක නොවන බව නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂයේ ව්‍යාපාරික කටයුතු පුළුල් කර සමාගම ලාභ ලබන තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇත. | සමාගමේ අරමුණු හා පරමාර්ථ ඉටුකරගත හැකි වන පරිදි සැලසුම් ගත වැඩසටහනක් යටතේ ක්‍රියාත්මක විය යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ සාමාන්‍යාධිකාරී තනතුර ඇතුළුව ප්‍රධාන කළමනාකරණ තනතුරු 3 ක් සඳහා ස්ථිර කාර්ය මණ්ඩලය පත් නොකර වැඩබැලීමේ පදනම මත ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන් එම තනතුරුවල කටයුතු කර තිබුණි. | ස්ථිර කාර්ය මණ්ඩලයක් පත් නොකිරීමට හේතුව අදාල තනතුරු වලට බඳවා ගැනීමේදී ඒ සඳහා වැටුප් හා අනෙකුත් දීමනා ලබා දීම සඳහා ආයතනයේ මූල්‍ය මට්ටම ශක්තිමත් වී නොතිබීම හා විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ පරිපාලිත ආයතනයක් වන අප ආයතනය වෙත කාර්යාංශයෙන් ඒ සඳහා සුදුසුකම් හා පළපුරුදු ලත් නිලධාරීන් එහි ඉහළ කළමනාකාරීත්වය මඟින් පත් කර තිබීමය. කෙසේ වුවද සාමාන්‍යාධිකාරී තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා මේ වන විට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | සමාගම ආරම්භ කිරීමෙන් රජය බලාපොරොත්තු වූ අරමුණ ඉටුනොවී සමාගම පාඩු ලබන තත්ත්වයට පත්වී තිබීම පිළිබඳව කළමනාකරණ අවධානය යොමුවිය යුතු අතර බඳවාගැනීමේ පටිපාටියට අනුකූලව සුදුසුකම්ලත් කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය සහ 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 2020 අගෝස්තු 19 දින දක්වා ප්‍රමාද කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

**4.2** වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ කාර්‍යසාධනය ඉහල නැංවීම සඳහා 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මඟින් සැලසුම්කරන ලද විදේශ රටවල උප නියෝජිතයන් මඟින් රැකියා අවස්ථා ලබාගැනීම (Job hunts), විදේශ රටවල කම්කරු සුභසාධන අංශ නිලධාරීන් මඟින් රැකියා අවස්ථා ප්‍රවර්ධනය කරගැනීම සහ අභ්‍යන්තර රැකියා බැංකුව සංවර්ධනය කිරීම යනාදී ක්‍රියාකාරකම් සමාගම විසින් ඉටුකර නොතිබුණි. | රැකියා අවස්ථා ලබාගැනීම සඳහා අවධානය යොමු කර ඇත.<br><br>විදේශ කම්කරු සුභසාධන අංශ දැනුවත් කිරීම් ලිඛිතව හා වාචිකව සිදුකලත් ගෘහ සේවිකාවන් සඳහා වන ඇබෑර්තු පමණක් ලැබී ඇත. අභ්‍යන්තර රැකියා බැංකුව යාවත්කාලීන කිරීමට උත්සාහ කල නමුදු පවතින මූල්‍යමය අර්බුදය මූලික කරගෙන විවිධ වර්ෂ වලදී සිදුකරන ලද ඉල්ලීම් සාර්ථක කරගැනීමට නොහැකි විය. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |